## නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම

REDECO

# රැකියා අවස්ථා

පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ශාරීරික අභ්‍යාස උපදේශක - කොන්ත්‍රාත් (කාන්තා/ පිරිමි)

**සුදුසුකම්**

ශාරීරික අභ්‍යාස උපදේශකවරයෙකු වශයෙන් රජයේ හෝ රජයට අනුබද්ධිත වෙනත් ක්‍රීඩා ආයතනයක ගෘහස්ත ක්‍රීඩා උපකරණ හැසිරවීම සම්බන්ධයෙන් පිළිගත් පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් ලැබූ ශාරීරික අභ්‍යාස උපදේශක වරයෙකු විය යුතුය.

| | | |
|---|---|---|
| වැටුප | : | රු. 30,310/= + රජයේ අනුමත ජීවන වියදම් දීමනාව + රජයේ අනුමත අන්තර් දීමනාව) |
| වයස් සීමාව | : | අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |

අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් වියයුතු අතර, ශාරීරික අභ්‍යාස උපදේශක වශයෙන් කටයුතු කිරීමට සුදුසු ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

සියලුම ජීව දත්ත සහිත අයදුම්පත් අධ්‍යාපන හා පළපුරුද්ද පිලිබඳ සහතික වල පිටපත් හා අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග පහත සඳහන් ලිපිනයට **2023.07.31** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ඉල්ලුම් කරන තනතුරේ නම අදාල ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ පැහැදිලිව සඳහන් කල යුතුය.

**සාමාන්‍යාධිකාරී,**
**ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම**
**අංක 28/10 ඒ, කිරිමණ්ඩල මාවත, නාවල, රාජගිරිය.**

රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් තමන්ගේ ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර, අදාල තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් එම තනතුරෙහි වැඩ භාර ගැනීමට තම ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

*සාමාන්‍යාධිකාරී*
*ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම*
*අංක 28/10 ඒ, කිරිමණ්ඩල මාවත, නාවල, රාජගිරිය.*